# විශේෂ අවධානයට

**<u>පොදු සමා වැඩසටහන යටතේ නව විදේශ ගමන් බලපත්‍ර අයදුම් කිරීම</u>**

- ඔබ දැනටමත් දන්නා පරිදි, පොදු සමා සහන කාලය 2018.10.31 දිනෙන් අවසන් වීමට නියමිත වන බැවින්, ඒ යටතේවන සහනයන් ලබා ගැනීමේ කාල සීමාවද එදිනෙන් අවසන්වීමට නියමිතය.

- ඒ අනුව, තවදුරටත් එක්සත් ආරාබි එමීර් රාජ්‍යයේ රැඳී සිටිමින් රැකියාවක් කිරීමට අපේක්ෂිත අය අදාළ වීසා ලබා ගැනීම සඳහා ප්‍රමාණවත් කාලයකට පෙරාතුව විදේශ ගමන් බලපත්‍රය ලබාගෙන, අදාළ ආයතන වෙත යොමු කල යුතුය.

- මේ වන විට පොදු සමා කාලයට අදාළව, කොළඹ පිහිටි ආගමන විගමන දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණයෙන් යුක්තව, **<u>එක් මාසයක්</u>** තුළ නව විදේශ ගමන් බලපත්‍රය කඩිනමින් ගෙන්වා ගැනීම සඳහා වූ විශේෂිය වැඩපිළිවෙලක් මෙම කොන්සල් ජනරාල් කාර්යාලය විසින් සළසා ඇත.

- ඉහත කරුණු සැළකිල්ලට ගෙන, මෙම පොදු සමා කාලය තුළ නව විදේශ ගමන් බලපත්‍රය ලබා ගෙන එයට වීසා බලපත්‍ර ලබා ගැනීමට අපේක්ෂා කරන අය සිටියි නම් ඉහත කාර්යයන් සඳහා ප්‍රමාණවත් කාල සීමාවක් ඉතිරි වන පරිදි **<u>කල් ඇතිව ගමන් බලපත්‍රය සඳහා අයදුම් කරන ලෙස</u>** මෙයින් දන්වා සිටිමු.

- **<u>2018 සැප්තැම්බර් මස 14</u>** වන දිනට පෙර ලැබෙන විදේශ ගමන් බලපත්‍ර අයදුම්පත් සඳහා නව ගමන් බලපත්‍රය ඉහත පොදු සමා කාල සීමාව ඇතුළත ගෙන්වා දීමට මෙම කොන්සල් ජනරාල් කාර්යාලයට හැකියාව ඇතත්, 2018 සැප්තැම්බර් 14 වන දිනෙන් පසු ලැබෙන අයදුම්පත් පිළිබඳව එවන් වගකීමක් දැරීමේ හැකියාව මෙම කොන්සල් ජනරාල් කාර්යාලයට නොමැති බව කාරුණිකව දන්වා සිටිමු.

*ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය - ඩුබායි*